# ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ විශ්වසනීයත්වය පිළිබඳ දර්ශකය

## මූලික වාර්තාව




විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
සෝෂල් ඉන්ඩිකේටර්
පෙබරවාරි 2024

ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිත ආයතනය (USAID) හරහා ඇමරිකානු ජනතාවගේ සහයෝගයෙන් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. මෙම අධ්‍යයනයෙහි අන්තර්ගතය සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සම්පූර්ණ වගකීම දරණ අතර ඒවා මඟින් USAID හෝ එක්සත් ජනපද රජයේ අදහස් පිළිබිඹු නොකරනු ලබයි.

# අන්තර්ගතය


හැඳින්වීම 5

ක්‍රමවේදය 6

විධායක සාරාංශය 7

සොයාගැනීම් 13

සමීක්ෂණය සිදු කරන ලද අවස්ථාවේ සමාජයේ විවිධ කොටස් විසින් යෝජනා කරන ලද ප්‍රධාන ඉල්ලීම් පිළිබඳ මහජන මතය 13
- ප්‍රස්ථාරය 01: ප්‍රධාන ඉල්ලීම් පිළිබඳ මහජන මතය 13
- ප්‍රස්ථාරය 02: ප්‍රධාන ඉල්ලීම් පිළිබඳ මහජන මතය - වයස 13

යෝජිත ත්‍රස්ත විරෝධී පනත පිළිබඳ මතය 14
- ප්‍රස්ථාරය 03: යෝජිත ත්‍රස්ත විරෝධී පනත පිළිබඳ දැනුවත්භාවය 14
- ප්‍රස්ථාරය 04: යෝජිත ත්‍රස්ත විරෝධී පනත පිළිබඳ දැනුවත්භාවය - වයස 14
- ප්‍රස්ථාරය 05: යෝජිත ත්‍රස්ත විරෝධී පනත අනුමත කිරීම 15
- ප්‍රස්ථාරය 06: යෝජිත ත්‍රස්ත විරෝධී පනත අනුමත නොකිරීමට හේතු 15

යෝජිත මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳ මහජන මතය 16
- ප්‍රස්ථාරය 07: යෝජිත මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳ දැනුවත්භාවය 16
- ප්‍රස්ථාරය 08: යෝජිත මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳ දැනුවත්භාවය - වයස 16
- ප්‍රස්ථාරය 09: යෝජිත මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත අනුමත කිරීම 17
- ප්‍රස්ථාරය 10: යෝජිත මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත අනුමත නොකිරීමට හේතු 17

පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් රජය විසින් ගෙන ඇති පියවරයන් පිළිබඳ මතය 18
- ප්‍රස්ථාරය 11: පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් රජය විසින් ගෙන ඇති පියවරයන් පිළිබඳ මහජන මතය 18
- ප්‍රස්ථාරය 12: පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් රජය විසින් ගෙන ඇති පියවරයන් පිළිබඳ මහජන මතය - ජනවාර්ගිකත්වය 18
- ප්‍රස්ථාරය 13: පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් රජය විසින් ගෙන ඇති පියවරයන් පිළිබඳ මහජන මතය - ආගම 19
- ප්‍රස්ථාරය 14: පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් රජය විසින් ගෙන ඇති පියවරයන් පිළිබඳ මහජන මතය - වයස 19
- ප්‍රස්ථාරය 15: පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් සිදු කළ විමර්ශන පිළිබඳ මහජන මතය 20
- ප්‍රස්ථාරය 16: පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් ජාත්‍යන්තර මැදිහත්වීම පිළිබඳ මහජන මතය - ජනවාර්ගිකත්වය 20
- ප්‍රස්ථාරය 17: පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් ජාත්‍යන්තර මැදිහත්වීම පිළිබඳ මතය - ආගම 21

මලෙයහ දෙමළ ප්‍රජාව 22
ප්‍රස්ථාරය 18: මලෙයහ දෙමළ ප්‍රජාවට වසර 200 ගතවීම පිළිබඳ දැනුවත්භාවය 22
ප්‍රස්ථාරය 19: මලෙයහ දෙමළ ප්‍රජාවට වසර 200 ගතවීම පිළිබඳ දැනුවත්භාවය - ජනවාර්ගිකත්වය 22
ප්‍රස්ථාරය 20: මලෙයහ දෙමළ ප්‍රජාවට වසර 200 ගතවීම පිළිබඳ දැනුවත්භාවය - වයස 23
ප්‍රස්ථාරය 21: ලයින් කාමරවල ජීවත් වන මලෙයහ දෙමළ ප්‍රජාවට ඉඩම් හිමිකම ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම සඳහා සහාය ලබා දීම 23
ප්‍රස්ථාරය 22: ලයින් කාමරවල ජීවත් වන මලෙයහ දෙමළ ප්‍රජාවට ඉඩම් හිමිකම ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම සඳහා සහාය ලබා දීම - ජනවාර්ගිකත්වය 24

මැතිවරණ වියදම් නියාමන පනත 25
ප්‍රස්ථාරය 23: මැතිවරණ ව්‍යාපාරය සඳහා වියදම් කිරීම පිළිබඳ මහජන මතය 25
ප්‍රස්ථාරය 24: මැතිවරණ ව්‍යාපාරය සඳහා වියදම් කිරීම පිළිබඳ මහජන මතය - වයස 25
ප්‍රස්ථාරය 25: මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත පිළිබඳ දැනුවත්භාවය 26
ප්‍රස්ථාරය 26:මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත පිළිබඳ දැනුවත්භාවය - වයස 26
ප්‍රස්ථාරය 27: මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත පිළිබඳ මහජන මතය 26

පළාත් පාලන ආයතන සහ පළාත් සභා ක්‍රියාත්මක නොවීම 27
ප්‍රස්ථාරය 28: පළාත් පාලන ආයතන ක්‍රියාත්මක නොවීමේ තත්ත්වය මහජනතාවට බලපාන ආකාරය 27
ප්‍රස්ථාරය 29: ප්‍රදේශය අනුව පළාත් පාලන ආයතන ක්‍රියාත්මක නොවීමේ තත්ත්වය මහජනතාවට බලපාන ආකාරය 27
ප්‍රස්ථාරය 30: පළාත් සභා ක්‍රියාත්මක නොවීමේ තත්ත්වය මහජනතාවට බලපාන ආකාරය 28
ප්‍රස්ථාරය 31: පළාත් සභා ක්‍රියාත්මක නොවීමේ තත්ත්වය මහජනතාවට බලපාන ආකාරය - ප්‍රදේශය 28

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි යෝජිත ප්‍රතිපත්තිමය වෙනස්කම්/ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන මතය 29
ප්‍රස්ථාරය 32: ජාත්‍යන්තර මූල්‍ය අරමුදයෙහි යෝජිත ප්‍රතිපත්තිමය වෙනස්කම්/ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුවත්භාවය 29
ප්‍රස්ථාරය 33: ජාත්‍යන්තර මූල්‍ය අරමුදයෙහි යෝජිත ප්‍රතිපත්තිමය වෙනස්කම්/ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුවත්භාවය - වයස සහ ප්‍රදේශය 29
ප්‍රස්ථාරය 34: ජාත්‍යන්තර මූල්‍ය අරමුදයෙහි යෝජිත ප්‍රතිපත්තිමය වෙනස්කම්/ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන මතය 30
ප්‍රස්ථාරය 35: ජාත්‍යන්තර මූල්‍ය අරමුදයෙහි යෝජිත ප්‍රතිපත්තිමය වෙනස්කම්/ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන මතය - වයස සහ ප්‍රදේශය 30

පළාත් සභා ක්‍රමය පිළිබඳ මහජන මතය 31
ප්‍රස්ථාරය 36: පළාත් සභා ක්‍රමය පිළිබඳ මහජන මතය 31
ප්‍රස්ථාරය 37: පළාත් සභා ක්‍රමය පිළිබඳ මහජන මතය - ජනවාර්ගිකත්වය 31
ප්‍රස්ථාරය 38: පළාත් සභා ක්‍රමය පිළිබඳ මහජන මතය - වයස සහ ප්‍රදේශය 32
ප්‍රස්ථාරය 39: පළාත් සභාවට ලබා දී ඇති ඉඩම් බලතල ක්‍රියාත්මක කිරීමේ එකඟතාවය 32
ප්‍රස්ථාරය 40: පළාත් සභාවට ලබා දී ඇති ඉඩම් බලතල ක්‍රියාත්මක කිරීමේ එකඟතාවය - ජනවාර්ගිකත්වය 33
ප්‍රස්ථාරය 41: පළාත් සභාවට ලබා දී ඇති ඉඩම් බලතල ක්‍රියාත්මක කිරීමේ එකඟතාවය - වයස 33

දූෂණ මට්ටම පිළිබඳ මහජන මතය 34
ප්‍රස්ථාරය 42: දූෂණ මට්ටම පිළිබඳ මහජන මතය 34
ප්‍රස්ථාරය 43: දූෂණ මට්ටම පිළිබඳ මහජන මතය - වයස සහ ප්‍රදේශය 34

# හැඳින්වීම

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් (Social Indicator -SI) විසින් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ විශ්වසනීයත්ව දර්ශකයේ පස්වන අදියර යටතේ මෙම සමීක්ෂණ වාර්තාව සකස් කර ඇත. වර්තමාන රජය ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ආර්ථික හා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙන යමින් සිටියි. මෙම අර්බුදයට වගකිව යුත්තේ සාමාන්‍ය පුරවැසියන් නොවුණත්, එය විසඳීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාවලියේ බර ඔවුන් මත පැටවීම සිදු වී ඇත. එවැනි පසුබිමක් තුළ, රටේ වර්තමාන ආණ්ඩුකරණ තත්ත්වය පිළිබඳ මහජන මතය ග්‍රහණය කර ගැනීම සඳහා මෙම මත විමසුම සැලසුම් කර ඇත.

මෙම දේශපාලන කතිකාව තුළ මතු වූ ප්‍රධාන ඉල්ලීම්, යෝජිත ත්‍රස්ත විරෝධී පනත, මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත, පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් රජය ගෙන ඇති පියවරයන්, මලෙයෙහ දෙමළ ප්‍රජාව පිළිබඳ දැනුවත්භාවය සහ ඒ පිළිබඳ මතය, මැතිවරණ වියදම් නියාමන පනත, පළාත් පාලන ආයතන සහ පළාත් සභා ක්‍රියාත්මක නොවීමේ තත්ත්වය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් යෝජනා කරන ලද ප්‍රතිපත්තිමය වෙනස්කම්/ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳ මතය, පළාත් සභා ක්‍රමය පිළිබඳ මහජන මතය සහ දූෂණ මට්ටම පිළිබඳ මහජන මතය වැනි කරුණු කෙරෙහි මෙම මත විමසුම අවධානය යොමු කරයි.

# ක්‍රමවේදය

අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතා කරමින් ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම් හතරෙන් (සිංහල, දෙමළ, මලෙයහ දෙමළ සහ මුස්ලිම්) තෝරාගත් පුද්ගලයන් 1350 ක නියැදියක් වශයෙන් යොදාගෙන මෙම සමීක්ෂණය සිදු කරන ලදී. දත්ත එකතු කිරීම සඳහා මුහුණට මුහුණලා සිදු කරන සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කර ඇති අතර මෙම සමීක්ෂණයට ක්ෂේත්‍ර සමීක්ෂකයන් 80ක් (පුරුෂයන් සහ ස්ත්‍රීන්) සහභාගී කරගනිමින් දත්ත රැස් කිරීම සිදු කරන ලදී. ජනගහනයේ ජනවාර්ගිකත්වය සහ ප්‍රාදේශීය විවිධත්වය ග්‍රහණය කර ගැනීම සඳහා බහු-අදියර අහඹු ස්ථර නියැදි තාක්ෂණය භාවිතයෙන් නියැදිය තෝරා ගන්නා ලදී. එබැවින් මෙම සමීක්ෂණය දිස්ත්‍රික්ක 25 තුළ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශයන්හි වෙසෙන ස්ත්‍රීන් පුරුෂයන් යන දෙපාර්ශවයේම අදහස් ලබා ගෙන සිදු කර ඇත. මෙම සමීක්ෂණය සඳහා ක්ෂේත්‍ර කටයුතු 2023 නොවැම්බර් 6 වන දින සිට 23 වන දින අතර කාලයේ සිදු කරන ලදී. මෙහිදී ජනගහනයේ දිස්ත්‍රික්කය සහ ජනවාර්ගික අනුපාතය පිළිබිඹු කිරීම සඳහා දත්ත කට්ටලය බර තබා ඇත. සමාජීය විද්‍යාවන් සඳහා වන සංඛ්‍යාන පැකේජය (SPSS) භාවිතයෙන් දත්ත කට්ටලය විශ්ලේෂණය කරන ලදී.

# විධායක සාරාංශය

## සමීක්ෂණය සිදු කරන ලද අවස්ථාවේ සමාජයේ විවිධ කොටස් විසින් යෝජනා කරන ලද ප්‍රධාන ඉල්ලීම් පිළිබඳ මහජන මතය

- වර්තමාන රජයට ඉදිරිපත් කර ඇති සියලුම යෝජනා සඳහා ශ්‍රී ලාංකිකයන්ගෙන් අතිමහත් බහුතරයක් (94% ට වැඩි) සහාය දක්වයි. එබැවින්, 'සියලුම දේශපාලඥයින් විගණනයට ලක් කළ යුතු අතර ඔවුන්ගේ විගණනයට ලක් නොවන සියලුම වත්කම් රාජසන්තක කළ යුතුය, යන යෝජනාවට ඔවුහු එකඟත්වය පළ කරති. එසේම, 'මැතිවරණය නියමිත වේලාවට පැවැත්විය යුතු බව' සහ 'ආර්ථික අර්බුදයට වගකිව යුත්තන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම'(වගවීමට ලක් කිරීම) යන යෝජනාවලට ද ඔවුහු එකඟ වෙති. තව ද, 'ජනාධිපතිවරයා ඇතුළු සියලුම දේශපාලනඥයන් තම වත්කම් හෙළි කළ යුතුය 'යන යෝජනාවට ද ඔවුන් විසින් සහාය පළ කරන ලදී.
- වැඩිහිටි ජනගහනයට (94.2%) සාපේක්ෂව තරුණ ජනගහනයෙන් සුළු වශයෙන් ඉහළ ප්‍රතිශතයක් (97.3%) විශ්වාස කරන්නේ, දේශපාලනඥයන් වගවිය යුතු බවයි. කෙසේ වෙතත්, මැතිවරණය නියමිත වේලාවට පැවැත්විය යුතු බවට තරුණ හා වැඩිහිටි ජනගහනයෙන් සමාන ප්‍රතිශතයක් එකඟ වේ.

## යෝජිත ත්‍රස්ත විරෝධී පනත පිළිබඳ මහජන මතය

- 2023 සැප්තැම්බර් 15 දින ගැසට් කරන ලද යෝජිත ත්‍රස්ත විරෝධී පනත සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට වඩා (61.5%) පිරිසක් දැනුවත්ය නැත.
- දැනුවත්භාවයේ අවම බව සියලුම වයස් කාණ්ඩයන්හි දක්නට ලැබෙන අතර, ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට වඩා වැඩි පිරිසක් මේ සම්බන්ධයෙන් නොදැනුවත්භාවයක් පෙන්නුම් කරයි.
- යෝජිත ත්‍රස්ත විරෝධී පනත (38.5%) පිළිබඳ දැනුවත්භාවය සහිත පුද්ගලයන්ගෙන් බහුතරයක් (72.6%) මෙම පනත අනුමත නොකරයි.
- ප්‍රතිචාරකයන්ගෙන් අකමැත්ත සඳහා හේතු දක්වන ලෙස ඉල්ලා සිටි විට, ඔවුන් විවිධ හේතු ඉදිරිපත් කළේය. එහිදී, ඉදිරිපත් කර ඇති සියලුම හේතු අතර, වඩාත් කැපී පෙනෙන ලෙස අවධාරණය කරන ලද එක් හේතුවක් නම්, 'බලයේ සිටින අය මෙය තම වාසිය සඳහා (85.1%) අවභාවිතා කරන බවයි'. මීළඟට අවධාරණය කරන ලද හේතුව වන්නේ 'එය ජනතාවගේ මානව හිමිකම්වලට (72.5%) ඍණාත්මක ලෙස බලපානු ඇති බවයි. අනෙක් හේතුව ලෙස 'පවත්නා නීතිය ප්‍රමාණවත් බවත් , එබැවින් මේ අවස්ථාවේ නව නීති අවශ්‍ය නොවන බව' තුන්වන හේතුව (31.2%) ලෙස අවධාරණය කළේය.

## යෝජිත මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳ මහජන මතය

- 2023 සැප්තැම්බර් 18 දින ගැසට් කරන ලද යෝජිත මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳ බහුතරයක් (71.6%) දැනුවත්ය නැත.
- යෝජිත මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳ අවම දැනුවත්භාවයක් සෑම වයස් කාණ්ඩයක් තුළින් ම පිළිබිඹු වේ. කෙසේ වෙතත්, තරුණ ජනගහනය (අවුරුදු 18-29 අතර) හා සසඳන විට වැඩිහිටි ජනගහනය (අවුරුදු 30ට වැඩි) අතර මෙම දැනුවත්භාවයේ අවම බව සුළු වශයෙන් ඉහළ ය.
- යෝජිත මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳ දැනුවත්භාවයක් ඇති පුද්ගලයන්ගෙන් 28.4% න් බහුතරයක් (71.1%) එය අනුමත නොකරයි.
- ප්‍රතිචාරකයන්ගෙන් යෝජිත මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පතට ඇති අකමැත්ත සඳහා හේතු දක්වන ලෙස ඉල්ලා සිටි විට, ඔවුන් විසින් විවිධ හේතු ඉදිරිපත් කරන ලදී. එහිදී ඉදිරිපත් කරන ලද සියලුම හේතු අතරින්, වඩාත් කැපී පෙනෙන ලෙස අවධාරණය කරන ලද හේතුව වන්නේ 'බලයේ සිටින අය එය තම වාසිය සඳහා (82.5%) අවභාවිතා කරන බවයි'. මීළඟට ඔවුන් මතු කළ හේතුව වන්නේ මෙය ජනතාවගේ මානව හිමිකම්වලට (77.5%) අහිතකර ලෙස බලපාන බවයි. එසේම මෙහිදී තුන්වන හේතුව (43.2%) ලෙස ඉස්මතු කළේ මෙය 'විකල්ප දේශපාලන මතයක් ප්‍රකාශ කිරීමේ හැකියාව සීමා කළ හැකිය යන කාරණයයි.

## පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් රජය විසින් ගෙන ඇති පියවරයන් පිළිබඳ මහජන මතය

- පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සහ වගකිවයුත්තන් කවුරුන්ද, වගවිය යුත්තේ කවුරුන්ද යන්න විමර්ශනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ශ්‍රී ලාංකිකයන්ගෙන් අතිමහත් බහුතරයක් (89.6%) සෑහීමකට පත් නොවේ.
- බහුතරයක් මේ සම්බන්ධයෙන් තම අතෘප්තිය ප්‍රකාශ කරන අතර ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් තුළ මෙම අතෘප්තිය දක්නට ලැබේ.
- අනෙකුත් ආගමික කණ්ඩායම් (මුස්ලිම් සහ හින්දු) වලට වඩා බෞද්ධ සහ ක්‍රිස්තියානි ප්‍රජාව අතර අතෘප්තිමත්භාවය සාපේක්ෂ වශයෙන් ඉහළ ය.
- තරුණ ජනගහනයෙන් (අවුරුදු 18-29) සුළු වශයෙන් වැඩි ප්‍රතිශතයක් තම අතෘප්තිය ප්‍රකාශ කිරීමත් සමඟ සියලු වයස් කාණ්ඩ අතර ද මේ සම්බන්ධයෙන් අතෘප්තිමත්භාවයක් දක්නට ලැබේ.
- පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයට අදාළ විමර්ශන සම්බන්ධයෙන් විවිධ පාර්ශව විසින් සිදු කරන ලද විවිධ මත පිළිබඳව ප්‍රතිචාරකයින්ගෙන් මෙහිදී විමසන ලදී. ඒ අතරින් 34.4% ක් ශ්‍රී ලාංකිකයින් මෙම සිද්ධිය සම්බන්ධයෙන් ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්විය යුතු බව විශ්වාස කරන අතර 32.8%ක් අවධාරණය කරන්නේ ජාත්‍යන්තර නිරීක්ෂකයින් සමඟ අභ්‍යන්තර පරීක්ෂණයක් ද පැවැත්විය යුතු බවයි. එසේම, 21.8% ක් විශ්වාස කරන්නේ අභ්‍යන්තර පරීක්ෂණයක් පමණක් ප්‍රමාණවත් බවයි.
- මෙම සිද්ධිය සම්බන්ධයෙන් ජාත්‍යන්තර පරීක්ෂණයක් හෝ ජාත්‍යන්තර නිරීක්ෂකයින් සමඟ අභ්‍යන්තර පරීක්ෂණයක් ද පැවැත්විය යුතු යැයි විශ්වාස කරන පිරිසෙන් ඉහළ අගයක් සුළුතර ප්‍රජාවන් (දෙමළ, මලෙයහ දෙමළ සහ මුස්ලිම්) වේ.

- මෙම සිද්ධිය සම්බන්ධයෙන් ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්විය යුතු යැයි විශ්වාස කරන අය අතර ක්‍රිස්තියානි ප්‍රජාව (රෝමානු කතෝලික සහ රෝමානු නොවන කතෝලික) සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක සිටින අතර ඔවුන්ගෙන් අඩකට වඩා වැඩි පිරිසක් මෙම ප්‍රකාශයට තම සහාය පළ කරයි. එසේම මුස්ලිම් ප්‍රජාවෙන් අඩකට ආසන්න පිරිසක් (46.9%) ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්විය යුතු බව විශ්වාස කරයි. ඊට එදිරිව, ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්විය යුතුය සහ ජාත්‍යන්තර නිරීක්ෂකයින් සමඟ අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්විය යුතුය යන කාරණය අතර බෙදී සිටින බෞද්ධ සහ හින්දු ප්‍රජාව අතර මිශ්‍ර මතයක් මෙහිදී ප්‍රදර්ශනය කරන බව පෙනී යයි.

## මලෙයහ දෙමළ ප්‍රජාව

- ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට වැඩි පිරිසක් (53.7%) තේ සහ රබර් වතුවල සේවය කිරීම සඳහා මලෙයහ දෙමළ ප්‍රජාවේ පළමු කණ්ඩායම ශ්‍රී ලංකාවට ගෙන්වා වසර 200ක් ගත වී ඇති බව පිළිබඳ දැනුවත්භාවයක් ඇත.
- මෙම දැනුවත්භාවය සුළුතර ප්‍රජාවන් අතර සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතින අතර, දෙමළ සහ මලෙයහ දෙමළ ප්‍රජාවෙන් 75%කට වැඩි පිරිසක් එම දැනුවත්භාවය තහවුරු කරයි. එසේම, මුස්ලිම් ප්‍රජාවෙන් 60% කට වැඩි පිරිසක් ද මෙම කරුණ පිළිබඳ සිය දැනුවත්භාවය තහවුරු කරනු ලබයි. නමුත් මෙහි දැකිය හැකි විශේෂතම කාරණයක් වන්නේ, සිංහල ප්‍රජාවෙන් අඩක් (52%) ප්‍රකාශ කරන්නේ මලෙයහ දෙමළ ප්‍රජාවේ පළමු කණ්ඩායම ශ්‍රී ලංකාවට ගෙන්වා තේ සහ රබර් වතුවල වැඩ කිරීමට වසර 200 ක් ගත වී ඇති බව පිළිබඳ දැනුවත්භාවයක් නොමැති බවයි.
- තරුණ වයස් කාණ්ඩයට (අවුරුදු 18-29) වඩා වැඩිහිටි වයස් කාණ්ඩය (අවුරුදු 30 ට වැඩි) අතර මෙම දැනුවත්භාවය කැපී පෙනෙන ලෙස ඉහළ ය.
- පරම්පරා ගණනාවක් වතුකරයේ ජීවත්වන මෙම මලෙයහ දෙමළ ප්‍රජාවට ලයින් කාමර වෙනුවට නීත්‍යානුකූල හිමිකාරිත්වය සහිතව තමන්ටම අයත් වන ඉඩමක් සහ ප්‍රමිතියෙන් යුතු නිවසක් ලබාදිය යුතු බවට ඔවුන් දක්වන සහාය කෙතරම් දැයි විමසූ විට, ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩක් (65.5%) ප්‍රකාශ කරන්නේ තමන් මෙම ඉල්ලීමට බොහෝ දුරට සහාය දක්වන බවයි. ශ්‍රී ලාංකිකයන්ගෙන් තවත් 25.4%ක් ප්‍රකාශ කරන්නේ තමන් යම්තාක් දුරකට එම ඉල්ලීමට සහාය දක්වන බවයි.
- 'ලයින් කාමරවල' ජීවත් වන මලෙයහ දෙමළ ප්‍රජාවට ඉඩම් අයිතිය ලබා දීමේ ඉල්ලීම සඳහා සියලු ජනවාර්ගික ප්‍රජාව අතිමහත් බහුතරයක් තම සහාය ප්‍රකාශ කර ඇත. කෙසේ වෙතත්, මෙම ඉල්ලීම සඳහා සහාය දක්වන සුළුතර වාර්ගික ප්‍රජාවන්ගේ ප්‍රතිශතය සිංහල ප්‍රජාව හා සංසන්දනය කරන විට සාපේක්ෂ වශයෙන් ඉහළ අගයක් ගනී.

## මැතිවරණ වියදම් නියාමන පනත

- මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා වියදම් කිරීම සම්බන්ධයෙන් ප්‍රතිචාරකයන්ගෙන් ඔවුන්ගේ මතය විමසන ලදී. ඒ සඳහා ශ්‍රී ලාංකිකයන්ගෙන් අති බහුතරයක් (91.6%) ප්‍රකාශ කරන ලද්දේ, අපේක්ෂකයෙකුට මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා වියදම් කළ හැකි මුදල් ප්‍රමාණයේ සීමාවන් පැවතිය යුතු බවයි.
- සියලුම වයස් කාණ්ඩවල සිටින ශ්‍රී ලාංකිකයන්ගෙන් අතිමහත් බහුතරයක් මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා අපේක්ෂකයෙකුට වියදම් කළ හැකි මුදල් ප්‍රමාණයේ සීමාවන් පැවතිය යුතු බව විශ්වාස කරයි.

- සෑම මැතිවරණයකදීම පිළිගත් දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් සහ අපේක්ෂකයින් විසින් දරනු ලබන වියදම් නියාමනය කිරීම සඳහා 2023 ජනවාරි 19 වන දින පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයන්ගෙන් සැලකිය යුතු (78.5% ක්) පිරිසක් දැන සිටියේ නැත.

- වැඩිහිටි ජනතාව (අවුරුදු 30 ට වැඩි) හා සංසන්දනය කරන විට තරුණ ජනගහනය (අවුරුදු 18-29) අතර මේ සම්බන්ධයෙන් නොදැනුවත්භාවය සුලු වශයෙන් ඉහළ මට්ටමක පවතින නමුත් මෙම පනත සම්බන්ධයෙන් දැනුවත්භාවයේ අවම බව සෑම වයස් කාණ්ඩයක ම පාහේ දක්නට ලැබේ.

- මෙම නව මැතිවරණ වියදම් නියාමන පනත මඟින් පිළිගත් දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් සහ අපේක්ෂකයින් විසින් දරනු ලබන මහා පරිමාණ වියදම් පාලනය කරනු ඇතැයි ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට වඩා (61.1%) විශ්වාස කරනු ලැබේ. එසේම අනෙක් අතට තවත් 36.2%ක් විශ්වාස කරන්නේ එමඟින් මැතිවරණ වියදම් කිසිසේත්ම පාලනය නොකරනු ඇති බවයි.

## පළාත් පාලන ආයතන සහ පළාත් සභා ක්‍රියාත්මක නොවීම

- **පළාත් පාලන ආයතන** ක්‍රියාත්මක නොවන තත්ත්වය ඔවුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට කොතරම් දුරට බලපා ඇතිදැයි ප්‍රතිචාරකයින්ගෙන් විමසූ විට, ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට වඩා (51.6%) ප්‍රකාශ කරන ලද්දේ, එය තමන්ට බලපෑමක් නොවන බවයි.

- **පළාත් පාලන ආයතන** ක්‍රියාත්මක නොවන තත්ත්වය ඔවුන්ට බලපා ඇතැයි විශ්වාස කරන පිරිස අතර නාගරික ජනගහනයේ පවුල් ඉහළ මට්ටමක සිටී. එසේම, ග්‍රාමීය ජනගහනයෙන් අඩක් (53.5%) විශ්වාස කරන්නේ පළාත් පාලන ආයතන ක්‍රියාත්මක නොවන තත්ත්වය ඔවුන්ට බලපෑමක් නොකරන බවයි.

- **පළාත් සභා** ක්‍රියාත්මක නොවන තත්ත්වය ඔවුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට කොතරම් දුරට බලපෑවේදැයි විමසූ විට, ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩක් (53.7%) ප්‍රකාශ කරන ලද්දේ එය තමන්ට බලපෑමක් නොවන බවයි.

- **පළාත් සභා** ක්‍රියාත්මක නොවන තත්ත්වය ඔවුන්ට බලපා ඇතැයි විශ්වාස කරන අය අතර නාගරික ජනගහනයේ පවුල් ඉහළ මට්ටමක සිටී. එසේම, ග්‍රාමීය ජනගහනයෙන් අඩක් (55.7%) විශ්වාස කරන්නේ පළාත් සභා ක්‍රියාත්මක නොවන තත්ත්වය ඔවුන්ට බලපෑමක් නොකරන බවයි.

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි (IMF) යෝජිත ප්‍රතිපත්තිමය වෙනස්කම්/ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන මතය

- ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට වැඩි පිරිසක් (60.2%) ප්‍රකාශ කර සිටින්නේ ආර්ථික අර්බුදයෙන් ගොඩඒමට මූල්‍ය ආධාර සැපයීමට අදාළව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් මෑතකදී මෙහෙයවන ලද පාලන විනිශ්චය කිරීමේ ප්‍රයත්නය පදනම්ව ශ්‍රී ලංකාවට යම් ප්‍රතිපත්තිමය වෙනස්කම්/ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් යෝජනා කර ඇති බව පිළිබඳ දැනුවත්භාවයක් පවතින බවයි.

- මෙහිදී වැඩිහිටි ජනගහනයට (අවුරුදු 30ට වැඩි) සාපේක්ෂව තරුණ ජනගහනයේ (අවුරුදු 18-29 අතර) දැනුවත්භාවය සාපේක්ෂ වශයෙන් ඉහළ අගයක් ගනී. එසේම, නාගරික ජනගහනයට (50.6%) සාපේක්ෂව ග්‍රාමීය ජනගහනය (62.3%) අතර මේ සම්බන්ධ දැනුවත්භාවය ඉහළ ය.

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් යෝජනා කරන ලද මෙම ප්‍රතිපත්තිමය වෙනස්කම්/ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වත්මන් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ශ්‍රී ලංකාවට වැදගත් බව ශ්‍රී ලාංකිකයන්ගෙන් 70%කට ආසන්න ප්‍රමාණයක් විශ්වාස කරනු ලබයි.
- මෙම මතවාදය සියලුම වයස් කාණ්ඩ මෙන්ම නාගරික - ග්‍රාමීය ප්‍රදේශයන් තුළ ද දක්නට ලැබේ.

## පළාත් සභා ක්‍රමය පිළිබඳ මහජන මතය

- පළාත් සභා ක්‍රමය පිළිබඳ මහජනතාවගේ මතය විමසූ විට, ශ්‍රී ලාංකිකයින්ගෙන් 30.7% ක් දැනට පවතින පළාත් සභා ක්‍රමය ඉදිරියට ගෙන යා යුතු බව ප්‍රකාශ කරන අතර 27.8% ක් එය අහෝසි කළ යුතු බව ප්‍රකාශ කරයි.
- සිංහල ප්‍රජාව, දැනට පවතින පළාත් සභා ක්‍රමය අහෝසි කළ යුතු බවට 32.9%ක් ප්‍රකාශ කරන අතර තවත් 30.3%ක් එය ඉදිරියට ගෙන යා යුතු බවට ප්‍රකාශ කිරීමෙන් මිශ්‍ර මතයක් පෙන්නුම් කරයි. මුස්ලිම් ප්‍රජාව සම්බන්ධයෙන් ගත් කල, දැනට පවතින පළාත් සභා ක්‍රමය දිගටම පැවතිය යුතු බවට අඩකට ආසන්න පිරිසකගේ (45%) මතය වී තිබේ. එසේ වුව ද, දෙමළ ප්‍රජාවගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් (46.8%) සහ මලෙයහ දෙමළ ප්‍රජාව (40.4%) ප්‍රකාශ කරන්නේ දැනට පවතින පළාත් සභා ක්‍රමයම අමතර බලතල සහිතව පවත්වාගෙන යා යුතු බවයි.
- පළාත් සභා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමට සහ එය අහෝසි කිරීමට සහාය වීම සම්බන්ධයෙන් වයස් කාණ්ඩවල මතය බෙදී පවතින බව පෙනේ. කෙසේ වෙතත්, වත්මන් පළාත් සභා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා තරුණ ජනගහනයට (අවුරුදු 18-29) වඩා වැඩිහිටි ජනගහනය (අවුරුදු 30 ට වැඩි) සාපේක්ෂව ඉහළ සහායක් ලබා දී ඇත. මීට අමතරව, තරුණ ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් (21%) අමතර බලතල සහිතව පළාත් සභා ක්‍රමය ඉදිරියට ගෙන යා යුතුය යන මතයට සහාය දක්වනු ලැබේ.
- මෙහිදී, නාගරික - ග්‍රාමීය ප්‍රදේශ හරහා ද ඒ ආකාරයේ සමාන මතයක් පිළිබිඹු අතර එනම්, ග්‍රාමීය සහ නාගරික ජනගහනය යන දෙඅංශයෙන්ම බෙදුණු මතයක් ප්‍රකාශ කරයි. කෙසේ වෙතත්, ග්‍රාමීය ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් (32.6%) පළාත් සභා අඛණ්ඩව පත්වාගෙන යාම සඳහා සහාය පළ කරන අතර එම අදහසට නාගරික ජනගහනයෙන් 21.2% ක පිරිසක් ද සහාය දක්වයි.
- "දැනටමත් පළාත් සභා වෙත බෙදා දී ඇති ඉඩම් බලතල මධ්‍යම රජය විසින් ක්‍රියාත්මක කළ යුතුය" යන ප්‍රකාශයට ඔවුන් එකඟ වන්නේද නැද්ද යන්න පිළිබඳව ප්‍රතිචාරකයින්ගෙන් විමසූ විට, ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට ආසන්න පිරිසක් (47.2%) එම ප්‍රකාශය සමඟ එකඟ වන බව දක්නට හැකිය.
- බහුතරයක් සිංහල (45.1%), දෙමළ (64.9%) සහ මලෙයහ දෙමළ (57.9%) ප්‍රජාවන් එම ප්‍රකාශය සමග එකඟතාවයක් දක්වයි. කෙසේ වෙතත්, මුස්ලිම් ප්‍රජාවගෙන් බහුතරයක් (48.4%) එම ප්‍රකාශය සමඟ එකඟ නොවේ.
- එම ප්‍රකාශය සමඟ සියලුම වයස් කාණ්ඩායම් එකඟවීම දක්නට ලැබෙන අතර ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් ඊට එකඟතාවය පළ කරයි.


## දූෂණ මට්ටම පිළිබඳ මහජන මතය

- ආර්ථික අර්බුදයට පෙර පැවැති තත්වය හා සසඳන විට, වර්තමානයේ රටේ දූෂණ මට්ටම වැඩි වී හෝ අඩු වී ඇතිදැයි ප්‍රතිචාරකයින්ගෙන් විමසූ විට, ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් (87.2%) ප්‍රකාශ කරන්නේ එය ඉහළ ගොස් ඇති බවයි.
- මෙම මතවාදය සියලුම වයස් කාණ්ඩායම් සහ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශයන්හි දක්නට ලැබේ.


# සොයාගැනීම්

## සමීක්ෂණය සිදු කරන ලද අවස්ථාවේ සමාජයේ විවිධ කොටස් විසින් යෝජනා කරන ලද ප්‍රධාන ඉල්ලීම් පිළිබඳ මහජන මතය

ප්‍රස්ථාර 01 - ප්‍රධාන ඉල්ලීම් පිළිබඳ මහජන මතය





ප්‍රස්ථාරය 02: ප්‍රධාන ඉල්ලීම් පිළිබඳ මහජන මතය - වයස




## යෝජිත ත්‍රස්ත විරෝධී පනත පිළිබඳ මතය


ප්‍රස්ථාරය 03: යෝජිත ත්‍රස්ත විරෝධී පනත පිළිබඳ දැනුවත්භාවය





ප්‍රස්ථාරය 04: යෝජිත ත්‍රස්ත විරෝධී පනත පිළිබඳ දැනුවත්භාවය - වයස



ප්‍රස්ථාරය 05: යෝජිත ත්‍රස්ත විරෝධී පනත අනුමත කිරීම





ප්‍රස්ථාරය 06: යෝජිත ත්‍රස්ත විරෝධී පනත අනුමත නොකිරීමට හේතු




## යෝජිත මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳ මහජන මතය


ප්‍රස්ථාරය 07: යෝජිත මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳ දැනුවත්භාවය





ප්‍රස්ථාරය 08: යෝජිත මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳ දැනුවත්භාවය - වයස



ප්‍රස්ථාරය 09: යෝජිත මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත අනුමත කිරීම





ප්‍රස්ථාරය 10: යෝජිත මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත අනුමත නොකිරීමට හේතු




## පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් රජය විසින් ගෙන ඇති පියවරයන් පිළිබඳ මතය


ප්‍රස්ථාරය 11: පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් රජය විසින් ගෙන ඇති පියවරයන් පිළිබඳ මහජන මතය





ප්‍රස්ථාරය 12: පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් රජය විසින් ගෙන ඇති පියවරයන් පිළිබඳ මහජන මතය - ජනවාර්ගිකත්වය




ප්‍රස්ථාරය 13: පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් රජය විසින් ගෙන ඇති පියවරයන් පිළිබඳ මහජන මතය - ආගම





ප්‍රස්ථාරය 14: පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් රජය විසින් ගෙන ඇති පියවරයන් පිළිබඳ මහජන මතය - වයස




ප්‍රස්ථාරය 15: පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් සිදු කළ විමර්ශන පිළිබඳ මහජන මතය




ප්‍රස්ථාරය 16: පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් ජාත්‍යන්තර මැදිහත්වීම පිළිබඳ මහජන මතය - ජනවාර්ගිකත්වය




ප්‍රස්ථාරය 17:පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් ජාත්‍යන්තර මැදිහත්වීම පිළිබඳ මතය - ආගම




## මලෙයහ දෙමළ ප්‍රජාව


ප්‍රස්ථාරය 18: මලෙයහ දෙමළ ප්‍රජාවට වසර 200 ගතවීම පිළිබඳ දැනුවත්භාවය





ප්‍රස්ථාරය 19: මලෙයහ දෙමළ ප්‍රජාවට වසර 200 ගතවීම පිළිබඳ දැනුවත්භාවය - ජනවාර්ගිකත්වය




ප්‍රස්ථාරය 20: මලෛයහ දෙමළ ප්‍රජාවට වසර 200 ගතවීම පිළිබඳ දැනුවත්භාවය - වයස




ප්‍රස්ථාරය 21: ලයින් කාමරවල ජීවත් වන මලෛයහ දෙමළ ප්‍රජාවට ඉඩම් හිමිකම ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම සඳහා සහාය ලබා දීම




ප්‍රස්ථාරය 22: ලයින් කාමරවල ජීවත් වන මලෛයහ දෙමළ ප්‍රජාවට ඉඩම් හිමිකම ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම සඳහා සහාය ලබා දීම - ජනවාර්ගිකත්වය




# මැතිවරණ වියදම් නියාමන පනත


ප්‍රස්ථාරය 23: මැතිවරණ ව්‍යාපාරය සඳහා වියදම් කිරීම පිළිබඳ මහජන මතය





ප්‍රස්ථාරය 24: මැතිවරණ ව්‍යාපාරය සඳහා වියදම් කිරීම පිළිබඳ මහජන මතය - වයස




ප්‍රස්ථාරය 25: මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත පිළිබඳ දැනුවත්භාවය




ප්‍රස්ථාරය 26:මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත පිළිබඳ දැනුවත්භාවය - වයස





ප්‍රස්ථාරය 27: මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත පිළිබඳ මහජන මතය




## පළාත් පාලන ආයතන සහ පළාත් සභා ක්‍රියාත්මක නොවීම


ප්‍රස්ථාරය 28: පළාත් පාලන ආයතන ක්‍රියාත්මක නොවීමේ තත්ත්වය මහජනතාවට බලපාන ආකාරය





ප්‍රස්ථාරය 29: ප්‍රදේශය අනුව පළාත් පාලන ආයතන ක්‍රියාත්මක නොවීමේ තත්ත්වය මහජනතාවට බලපාන ආකාරය



ප්‍රස්ථාරය 30: පළාත් සභා ක්‍රියාත්මක නොවීමේ තත්ත්වය මහජනතාවට බලපාන ආකාරය





ප්‍රස්ථාරය 31: පළාත් සභා ක්‍රියාත්මක නොවීමේ තත්ත්වය මහජනතාවට බලපාන ආකාරය - ප්‍රදේශය




## ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි යෝජිත ප්‍රතිපත්තිමය වෙනස්කම්/ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන මතය


ප්‍රස්ථාරය 32: ජාත්‍යන්තර මූල්‍ය අරමුදයෙහි යෝජිත ප්‍රතිපත්තිමය වෙනස්කම්/ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුවත්භාවය





ප්‍රස්ථාරය 33: ජාත්‍යන්තර මූල්‍ය අරමුදයෙහි යෝජිත ප්‍රතිපත්තිමය වෙනස්කම්/ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුවත්භාවය - වයස සහ ප්‍රදේශය



ප්‍රස්ථාරය 34: ජාත්‍යන්තර මූල්‍ය අරමුදලයෙහි යෝජිත ප්‍රතිපත්තිමය වෙනස්කම්/ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන මතය





ප්‍රස්ථාරය 35: ජාත්‍යන්තර මූල්‍ය අරමුදලයෙහි යෝජිත ප්‍රතිපත්තිමය වෙනස්කම්/ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන මතය - වයස සහ ප්‍රදේශය




## පළාත් සභා ක්‍රමය පිළිබඳ මහජන මතය


ප්‍රස්ථාරය 36: පළාත් සභා ක්‍රමය පිළිබඳ මහජන මතය





ප්‍රස්ථාරය 37: පළාත් සභා ක්‍රමය පිළිබඳ මහජන මතය - ජනවාර්ගිකත්වය




ප්‍රස්ථාරය 38: පළාත් සභා ක්‍රමය පිළිබඳ මහජන මතය - වයස සහ ප්‍රදේශය





ප්‍රස්ථාරය 39: පළාත් සභාවට ලබා දී ඇති ඉඩම් බලතල ක්‍රියාත්මක කිරීමේ එකඟතාවය



ප්‍රස්ථාරය 40: පළාත් සභාවට ලබා දී ඇති ඉඩම් බලතල ක්‍රියාත්මක කිරීමේ එකඟතාවය - ජනවාර්ගිකත්වය





ප්‍රස්ථාරය 41: පළාත් සභාවට ලබා දී ඇති ඉඩම් බලතල ක්‍රියාත්මක කිරීමේ එකඟතාවය - වයස




## දූෂණ මට්ටම පිළිබඳ මහජන මතය

ප්‍රස්ථාරය 42: දූෂණ මට්ටම පිළිබඳ මහජන මතය




ප්‍රස්ථාරය 43: දූෂණ මට්ටම පිළිබඳ මහජන මතය - වයස සහ ප්‍රදේශය



විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවි දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයක් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

ලිපිනය: නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව
දුරකථන: +94 (11) 2081384-6
වෙබ්: http://www.cpalanka.org

සෝෂල් ඉන්ඩිකේටර් යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි (CPA) සමීක්ෂණ පර්යේෂණ ඒකකය වන අතර එය වර්ෂ 1999 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කෙරුණි. එමඟින් සමාජ හා දේශපාලන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථිර, වෘත්තීය සහ ස්වාධීන සමීක්ෂණ මධ්‍යස්ථානයක් සඳහා දීර්ඝ කාලීනව පැවැති රික්තකයක් පුරවා ඇත. මත විමසීම් හරහා අදහස් ප්‍රකාශ කිරීම ප්‍රජාතන්ත්‍රවාදය සවිබල ගැන්වීමේ මෙවලමක්ය යන දැඩි විශ්වාසයෙන් යුක්තව සෝෂල් ඉන්ඩිකේටර් ආරම්භයේ සිටම සමාජ-ආර්ථික හා දේශපාලන ගැටළු රාශියක් පිළිබඳව මත විමසීම් පවත්වනු ලබයි.

ලිපිනය: නො. 6/1B,1/1, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව
දුරකථන: +94 112 584 050
වෙබ්: http://cpalanka.org/survey-research/